SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 86 S

සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය | කාලය පැය දෙකයි

නම .............................................

I - කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.


- අංක 01 සිට අංක 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(01) අප අවට සිටින පුද්ගලයන් සමඟ යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වා ගැනීම ....................................... යහපැවැත්ම වේ. (මානසික/ අධ්‍යාත්මික/ සමාජීය)

(02) රිකට්සියාව යනුවෙන් හඳුන්වනු ලබන්නේ ...................................... නිසා ඇතිවන රෝගයකි. (විටමින් A ඌනතාවය/ විටමින් D ඌනතාවය/ විටමින් B ඌනතාවය)

(03) ඇසීමේ දෝෂ ඇති වීමට හේතුවකි ...................................... . (වායු දූෂණය/ ජල දූෂණය/ ශබ්ද දූෂණය)

(04) මෙම රූප සටහනේ හිස්තැනට සුදුසු ක්‍රීඩාව වන්නේ ......................................
(පැරා ජම්ප්ස්/ වින්ඩ් සර්ෆින්/ ඇරොබික්ස්)




(05) නෙට්බෝල් ක්‍රීඩාවේ දී "ක්‍රීඩිකාව රැකීම" සිදු කළ හැකි ක්‍රම ...................................... කි. (4/ 3/ 5)


(06) නෙට්බෝල් ක්‍රීඩාවේ පන්දුව සතු කර ගත් ක්‍රීඩිකාව හා රකින ක්‍රීඩිකාව අතර තිබිය යුතු අවම දුර ප්‍රමාණය අඩි ...................................... ක් විය යුතුය. (2/ 4/ 3)

(07) උපකරණ රහිතව කළ හැකි ක්‍රීඩාවක් ලෙස ...................................... ක්‍රීඩාව දැක්විය හැකිය. (කබඩි/ රගර්/ එල්ලේ)

(08) යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ප්‍රමාණවත්ව පවත්වා ගැනීම තුළින් ...................................... සිදු වේ. (දැනුම බෙදා හදා ගැනීම/ සදාචාර සංවර්ධනය/ ගැටුම් ඇතිවීම)

(09) ...................................... පුද්ගලයෙක්ගෙන් තවත් පුද්ගලයෙකුට බෝ නොවේ. (ඩෙංගු රෝගය/ පිළිකා රෝගය/ ක්ෂය රෝගය)

(10) මෙම රූප සටහනේ දක්වා ඇත්තේ ...................................... රූපයකි.
(පසු කුදයේ/ ඔටු කුදයේ/ පැති කුදයේ)



- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) පුද්ගලයෙකුගේ සෞඛ්‍යවත් බව යනු රෝග හා දුබලතා වලින් තොරවීම සහ
   i. කායික, මානසික, අධ්‍යාත්මික යහපැවැත්මෙන් යුක්ත වීම යි.
   ii. කායික, මානසික, සමාජයීය යහපැවැත්මෙන් යුක්ත වීම යි.
   iii. කායික, මානසික, සමාජයීය සහ අධ්‍යාත්මික යහපැවැත්මෙන් යුක්ත වීම යි.
   iv. කායික, සමාජයීය සහ අධ්‍යාත්මික යහපැවැත්මෙන් යුක්ත වීම යි.

SLGURU.LK
For Educational Purpose Only


SLGURU.LK

(12) පාරිසරික හේතු මත ශරීරයේ වැරදි ඉරියව් ඇතිවීම වළක්වා ගැනීමට නම් අප කළ යුත්තේ,
i. නිවැරදි ලෙස ඖෂධ ගැනීම යි.
ii. ප්‍රමාණවත් නින්ද ලබා ගැනීම යි.
iii. උසස් පුද්ගලයින් අනුකරණය කිරීම යි.
iv. නිවැරදි ඉරියව් පවත්වා ගැනීම යි.

(13) එළිමහන් ක්‍රියාකාරකමක් වන කඳවුරු බැඳීමට අයත් වන්නේ,
i. දිශා සෙවීමය.
ii. ගිනිමැල ක්‍රීඩාය.
iii. ලිප් තැනීමය.
iv. ගස් නැගීමය.

(14) සංවිධානාත්මක හා එළිමහන් ක්‍රියාකාරකම්වල යෙදීම මගින් සපුරාගත හැකි මනෝ සමාජයීය අවශ්‍යතාවයකි.
I. නිරෝගීබව ඇතිවීම
ii. නීතිරීතිවලට අවනත වීම
iii. ශාරීරික යෝග්‍යතාවය
iv. ඉහත සියල්ලම

(15) වොලිබෝල් ක්‍රීඩාවේ වැළැක්වීමේ අවස්ථාවක් පෙන්වන මෙම රූපයේ "b" අක්ෂරයෙන් දැක්වෙන්නේ,
i. පන්දුව කරා ලඟා වීම යි.
ii. ඉපිලීම යි.
iii. සූදානම් වීම යි.
iv. පතිතවීම යි.




- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වගන්ති හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

(16) අන්තර් පුද්ගල සම්බන්ධතා ගුණාත්මකව පවත්වා ගැනීම නිසා යහපත් සිතිවිලි වර්ධනය වේ. ( )

(17) ඍජු ගතිගුණ සහිතවීම, තමාගේ දියුණුව සඳහා පමණක් කැපවීම ආත්ම සාක්ෂාත්කරණය කරගත් අයෙකුගේ ලක්ෂණය කි. ( )

(18) වැරදි ඉරියව් අවම කර ගැනීම සඳහා කාලය හා ශ්‍රමය වැය කිරීම නිෂ්ඵල ක්‍රියාවකි. ( )

(19) නෙට්බෝල් තරගයකදී විදුමට බාධාකරන අදහසින්, රකින ක්‍රීඩිකාවට විදුම් කණුව සෙලවිය හැකිය. ( )

(20) වොලිබෝල් ක්‍රීඩාවේ වැළැක්වීම සිදු කළ හැක්කේ ඉදිරිපෙළ ක්‍රීඩකයින්ට පමණි. ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

(01) පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන සතියේ දී, සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය කමිටුව මගින් පහත වැඩ සටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදී.

* ශරීර සුවතා වැඩ සටහන
* ප්‍රජාව හා එක්ව ක්‍රියාත්මක කළ ඩෙංගු මර්දන වැඩ සටහන
* මානව අවශ්‍යතා, නිවැරදි ඉරියව්, මත්ද්‍රව්‍ය භාවිතයේ අනිසි ප්‍රතිවිපාක හා සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ ළමුන් හා දෙමාපියන් දැනුවත් කිරීමේ දේශනය.
* සංවිධානාත්මක ක්‍රීඩා පිළිබඳ ප්‍රායෝගික වැඩ සටහන.

I. ප්‍රජාව හා සම්බන්ධව කල හැකි මෙහි සඳහන් නොවන වෙනත් වැඩ සටහන් 2 ක් ලියන්න. (ල. 02)
ii. සෞඛ්‍ය ප්‍රවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල. 02)
iii. දේශනයේ දී පහදා දීමට ඇතැයි ඔබ සිතන නිවැරදි ඉරියව් පවත්වා ගැනීමේ වාසි 2ක් ලියන්න. (ල. 02)
iv. නිවැරදි ඉරියව්වලට බාධාවන, ශාරීරික ආබාධ ඇතිවීමට බලපාන ප්‍රධාන හේතු 2 ක් ලියන්න. (ල. 02)
v. ඉහත ක්‍රීඩා වැඩසටහනේදී පන්දුවක් සහිතව කරන්නට ඇතැයි සිතිය හැකි සංවිධානාත්මක ක්‍රිඩා 2ක් ලියන්න. (ල. 02)
vi. "ලිබරෝ" ක්‍රීඩකයා හමුවන්නේ කුමන කණ්ඩායම් ක්‍රීඩාවේ ද? (ල. 02)
vii. ශරීර සුවතා වැඩසටහනට සහභාගිවීම තුළින් සිසුන්ට අත්වන වාසි 2 ක් ලියන්න. (ල. 02)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

viii. ක්‍රීඩා වර්ගීකරණයට අනුව ආත්මාරක්ෂක ක්‍රීඩා 2 ක් ලියන්න. (ල. 02)
ix. කායික වෙහෙස මග හරවා ගැනීමට කළ හැකි ගෘහස්ථ ක්‍රීඩා 2 ක් ලියන්න. (ල. 02)
x. මත්ද්‍රව්‍ය උවදුර සමාජයෙන් තුරන් කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග 2 ක් ලියන්න. (ල. 02)

(02) පුද්ගල ක්‍රියාකාරකම් මෙන්ම ස්වභාවික සංසිද්ධීන් ද සමාජ සෞඛ්‍යය කෙරෙහි බලපායි.

i. සමාජ සෞඛ්‍යය කෙරෙහි බලපාන ස්වභාවික ආපදා 2 ක් ලියන්න. (ල. 02)
ii. සෞඛ්‍ය ප්‍රවර්ධනයට අදාල මූලධර්ම 02 ක් ලියන්න . (ල. 04)
iii. සෞඛ්‍ය ප්‍රවර්ධනය සිදු වූ සමාජයක දැකිය හැකි ලක්ෂණ 04 ක් ලියන්න. (ල. 04)

(03) පාසල් අවධියේ සිට ම ආත්ම සාක්ෂාත්කරණ අවශ්‍යතාව පිළිබඳ දැනුවත්වීම අනාගත ජීවිතයේ සාර්ථකත්වයට හේතුවකි.

I. ආත්ම සාක්ෂාත්කරණය යන්න පැහැදිලි කරන්න. (ල. 02)
ii. ආත්ම සාක්ෂාත්කරණය සඳහා ළඟාවීමට ඔබ තුළ වර්ධනය කරගත හැකි කුසලතා 02 ක් නම් කරන්න. (ල. 04)
iii. ආත්ම සාක්ෂාත්කරණයට පත්වීමට නම් පුද්ගලයෙකු සතුවිය යුතු ගුණාංග 4 ක් ලියන්න. (ල. 04)

(04) යහපත් පෞරුෂයකින් හෙබි පුද්ගලයෙකු බිහි කිරීමට නිවැරදි ඉරියව් බෙහෙවින් උපකාරී වේ.

i. නිවැරදි ඉරියව්වක් යනු කුමක් ද? (ල. 02)
ii. වැරදි ඉරියව් සඳහා බලපාන කරුණු 2 ක් ලියන්න. (ල. 04)
iii. වැරදි ඉරියව් නිසා ඇතිවන හානි අවම කර ගැනීමට කටයුතු කළ යුතු ආකාර 4 ක් ලියන්න. (ල. 04)

(05) පුද්ගලයෙකුගේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට සංවිධානාත්මක ක්‍රීඩා හා එළිමහන් ක්‍රියාකාරකම් සුවිශේෂී දායකත්වයක් සපයයි.

I. සංවිධානාත්මක ක්‍රීඩාවල දැකිය හැකි ලක්ෂණ 02 ක් සඳහන් කරන්න. (ල. 02)
ii. ගවේෂණ හා විනෝද ක්‍රියාකාරකම් යටතේ සිදු කළ හැකි ක්‍රියාකාරකම් 03 ක් නම් කරන්න (ල. 03)
iii. සංවිධානාත්මක ක්‍රීඩා වර්ගීකරණයට අනුව පහත ක්‍රීඩා කුමන කාණ්ඩයට අයත් වේ දැයි දක්වන්න.
a. තරඟ ඇවිදීම b. කිමිදීම c. පැරා ජම්ප්ස්
d. මාර්ග ධාවන e. ටේබල් ටෙනිස් (ල. 05)

(06) සංවිධානාත්මක ක්‍රීඩා අතර ඉතා තරඟකාරී මෙන්ම ආකර්ශනීය ක්‍රීඩාවක් ලෙස වොලිබෝල් ක්‍රීඩාව දැක්විය හැකිය.

I. වොලිබෝල් ක්‍රීඩාවේ ප්‍රහාරය හා වැළැක්වීම හැර වෙනත් දක්ෂතා 2 ක් නම් කරන්න. (ල. 02)
ii. ප්‍රහාරක පහර යන්න හඳුන්වා ප්‍රහාරක පහරේ වැරදි 02 ක් සඳහන් කරන්න. (ල. 03)
iii. වොලිබෝල් ක්‍රීඩාවේ වැලැක්වීම පුහුණුවීම සඳහා ක්‍රීඩකයන් දෙදෙනෙකුට එක්ව සිදු කළ හැකි ක්‍රියාකාරකමක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(07) නෙට්බෝල් ක්‍රීඩාව කාන්තාවන් අතර ඉතා ජනප්‍රිය ක්‍රීඩාවකි.

I. නෙට්බෝල් තරඟයක දී විරුද්ධ පිලේ ක්‍රීඩිකාවක් හිතාමතා තල්ලු කිරීමේ දී ලබාදෙන දඬුවම කුමක්ද ? (ල. 02)
ii. නෙට්බෝල් ක්‍රීඩාවේ දී ආක්‍රමණය සාර්ථක කරගැනීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් සඳහන් කරන්න. (ල. 03)
iii. පන්දු විදීම පුහුණු කිරීම සඳහා සුදුසු ක්‍රියාකාරකමක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

SLGURU.LK
For Educational Purpose Only

“Live as if you were to die tomorrow. Learn as if you were to live forever.” — Mahatma Gandhi

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

# පළමුවාර පරීක්ෂණය 2019
# පිළිතුරු පත්‍රය
# 9 ශ්‍රේණිය සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය

## I කොටස

(01) සමාජීය (02) විටමින් D ඌනතාවය (03) ශබ්ද දූෂණය (04) වින්ඩ් සර්ෆින්
(05) 4. (06) 3. (07) කබඩි (08) දැනුම බෙදාහදා ගැනීම (09) පිළිකා රෝගය
(10) පසු කුදයේ (11) iii (12) iv (13) ii (14) ii (15) ii (16) √ (17) × (18) × (19) × (20) √
(ලකුණු 2×20 = 40)

## II කොටස

(01) I. සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම/ ශ්‍රමදාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම/ රෝග මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම .... ආදිය

ii. තමාගේත්, ප්‍රජාවගේත්, සෞඛ්‍ය ගැටලු අවම කිරීම සඳහා ස්වයං හැකියා ඇති අය බවට බලවන්ත කිරීම.

iii. අවම ශක්තිය වැයවීම/ කාර්යක්ෂමතාව වැඩිවීම/ අනතුරු හා ආබාධ අවමවීම/ ශාරීරික වේදනා අවම වීම.

iv. සංජානීය තත්ත්ව, පාරිසරික තත්ත්ව

v. වොලිබෝල්/ නෙට්බෝල්/ පාපන්දු/ පැසිපන්දු/ රග්බිපාපන්දු/ ක්‍රිකට්/ මේසපන්දු/ එල්ලේ

vi. වොලිබෝල් ක්‍රීඩාවේ

vii. ශාරීරික යෝග්‍යතාව ඇතිවීම/ ක්‍රියාශීලීබව/ නිරෝගී බව/ සාමූහික බව/ රිද්මය ගොඩනගා ගැනීම ආදි

viii. කරාතේ, ජූඩෝ, බොක්සිං, මල්ලව පොර, වූෂු

ix. කැරම්, චෙස්, දාම් ... වැනි මානසික හැකියා වඩවන ක්‍රීඩා

x. මත්ද්‍රව්‍ය වල අහිතකර ප්‍රතිඵල පිළිබඳ සමාජය දැනුවත් කිරීම/ මත්ද්‍රව්‍ය සඳහා නීතිරීති පැනවීම/ මාධ්‍ය ප්‍රචාරණ බුද්ධිමත්ව හඳුනා ගැනීම/ මත්ද්‍රව්‍ය වලට යොමු වූ අය පුනරුත්ථාපනය/ ක්‍රීඩා හා සෞන්දර්ය ක්‍රියාකාරකම්වලට යොමුවීම/ ආගමික කටයුතු වලට යොමුවීම ... ආදිය (ල. 02×10=20)

(02)i. සුනාමි, ගංවතුර, නියං, නායයාම් .... ආදිය (ල. 02)

ii. සෞඛ්‍යවත් ප්‍රතිපත්ති/ දැනුම හා කුසලතා සංවර්ධනය/ සෞඛ්‍යයට හිතකර පරිසරය/ ප්‍රජා සහභාගීත්වය/ සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය (ල. 04)

iii. ආකර්ෂණීය පරිසරයක් ගොඩනැගීම/ ඩෙංගු වැනි රෝග ප්‍රවණතාව අවම වීම/ සතුටින් ජීවත් විය හැකි පරිසරයක් ඇතිවීම/ ආර්ථික වාසි ලැබීම/ ගැටුම් අවම වීම/ සමාජ සබඳතා පුළුල් වීම/ සෞඛ්‍ය සඳහා වැයවන වියදම අඩුවීම/ පුද්ගල ක්‍රියාශීලිබව වැඩිවීම/ කාලය ඵලදායීව හා උපරිම ලෙස ප්‍රයෝජනයට ගතහැකි වීම/ ජීවිතයේ ගුණාත්මක බව ඉහළ යාම .... ආදි ගැලපෙන පිළිතුරු සඳහා (ල. 04)

(03)I. අප තුළ පවත්නා නිර්මාණශීලි කුසලතාවලින් සමාජයට උපරිම ලෙස සේවය කරමින් තෘප්තිමත්, නිවැරදි හා සැනසිලිදායක ජීවිතයක් ගත කිරීම (ල. 02)

ii. කායික, මානසික, සමාජීය, සෞන්දර්යාත්මක කුසලතා හෝ ක්‍රීඩා, චිත්‍ර, නැටුම්, සංගීතය, නිවේදන, නව නිර්මාණ, වෘත්තීය ..... ආදි ඕනෑම ක්ෂේත්‍රයක ප්‍රවීණයන් වීම (ල. 04)

iii. තමාගේ දක්ෂතා, කුසලතා සමාජ සුභ සිද්ධිය සඳහා යෙදවීම/ පවත්නා සම්පත්වලින් සෑහීමට පත්වීම/ යහපත් විනය ගරුක පුරවැසියෙකු ලෙස පිළිගැනීමට බඳුන්වීම/ අන්‍යයන්ට ගරු කිරීම සහ සැලකීම/ උගත් ශිල්පයෙහි ප්‍රවීණයෙකු වීම/ සෘජු ප්‍රතිපත්ති ඇති බව/ සාධාරණ ජීවනෝපායක් තිබීම/ සහනශීලී පරිසරයක විසීම/ ආදායමට සරිලන ලෙස දිවි පැවැත්ම සකසා ගැනීම ...... ආදි ගැලපෙන පිළිතුරු වලට (ල. 04)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(04)i. තමාගේ දෛනික කටයුතු අපහසුතාවයකින් තොරව, අඩු වෙහෙසකින් ඉටු කර ගැනීම පිණිස සිරුර නිවැරදිව හැසිරවීම නිවැරදි ඉරියව්වකි. (ල. 02)

ii. දෛනිකව වැඩි කාර්යභාරයක් ඉටු කිරීම/ ප්‍රමාණවත් විවේකයක් නොගැනීම/ ප්‍රමාණවත් ව්‍යායාම නොකිරීම/ ප්‍රමාණවත් නින්ද නොලැබීම/ නොදැනුවත්කම/ නොසැලකිල්ල/ වැරදි ඖෂධ භාවිතය ..... අදාල ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු දෙන්න. (ල. 04)

iii. රෝහල් වෙත යොමු වීම/ ව්‍යායාමයේ යෙදීම/ අනවශ්‍ය වෙහෙස හා නොසැලකිල්ල අවම කිරීම/ හොඳ පුරුදු ඇති කර ගැනීම/ ගැලපෙන ආහාර රටා අනුගමනය කිරීම/ සෑම විටම නිවැරදි මූලික ඉරියව් පවත්වා ගැනීම ..... ආදි ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු දෙන්න. (ල. 04)

(05)i. සම්මත නීතිරීති තිබීම/ නිශ්චිත ක්‍රීඩා පිටි යොදා ගැනීම/ නිශ්චිත ක්‍රීඩා උපකරණ යොදා ගැනීම/ නිශ්චිත ක්‍රීඩක සංඛ්‍යාවක් සිටීම. (ල. 02)

ii. කැලෑ ගවේෂණය/ වනාන්තර ගවේශණය/ පාපැදි සවාරි/ පිහිනීම/ ඔරු පැදීම/ මාළු බෑම/ මාලිමා භාවිතය. (ල. 03)

iii. a. මලල ක්‍රීඩා b. ජල ක්‍රීඩා c. ගුවනේ ක්‍රීඩා d. මලල ක්‍රීඩා e. ගෘහස්ථ ක්‍රීඩා (ල. 05)

(06)i. පිරිනැමීම/ ලබා ගැනීම/ එසවීම/ පිටිය රැකීම. (ල. 02)

ii. පිරිනැමීම හා වැලැක්වීම හැර විරුද්ධ පිලට බෝලය යැවීමට යොදා ගන්නා සෑම ක්‍රියාවක්ම ප්‍රහාරක පහරක් ලෙස හැඳින්වේ. (ල. 01)

<u>ප්‍රහාරක පහරේ වැරදි</u>

විරුද්ධ පිලේ බෝලයකට පහර දීම/ බෝලය පිටියෙන් පිටත යන ලෙස පහරදීම/ පසුපෙළ ක්‍රිඩකයෙකු ඉදිරි කලාපයට පැමිණ දැලට ඉහළින් ඇති පන්දුවකට පහරදීම/ ලිබරෝ ක්‍රීඩකයා ප්‍රහාරය එල්ල කිරීම/ පසුපෙල ක්‍රීඩකයෙකු ප්‍රහාරය එල්ල කිරීම ආදි ... (ල. 02)

iii. අදාල නිවැරදි ක්‍රියාකාරකම් විස්තර කර තිබේ නම් හෝ රූප සටහන් ඇඳ තිබේ නම් ලකුණු දෙන්න. (ල. 05)

(07)i. දඬුවම් යැවීම හෝ දඬුවම් විදීම (ල. 02)

ii. රකින ක්‍රීඩිකාවගෙන් නිදහස් වීම/ දිශා මාරු කරමින් දිවීම/ පන්දුව තම විදුම් කණුව තෙක් ගෙන යාම/ දෑත් දිගු කොට පන්දුව ලබා ගැනීම ආදි (ල. 03)

iii. අදාල නිවැරදි ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දෙන්න./ රූප සටහන් ඇඳ තිබේ නම් ලකුණු දෙන්න. (ල. 05)

SLGURU.LK
For Educational Purpose Only